# ඉන්දියාව, විසඳුම හා ගුවන්යානා

මේ සතියේ ද අපට වෙච්ච දේ හා ඉන් ගොඩ එම ලිපි පෙළේ මීළඟ ලිපිය පළකිරීමට නොහැකිවන්නේ වෙනත් වැදගත් කරුණක් ගැන ලිවීමට ඇති හෙයිනි. අප ගිය සතියේ පෙන්වා දුන් පරිදි ඉන්දියාව සමග යැයි බොහෝ දෙනා සිතූ ප්‍රශ්නය වූයේ කරුණානිධි සමග මිස ඉන්දියාව සමග නො වෙයි. ඉන්දියාවට විරුද්ධව පෙළපාළි යෑමෙන් නොව, රාජ්‍ය තාන්ත්‍රික ව ප්‍රශ්නය විසඳාගත හැකි බව අපි පෙන්වා දුනිමු. අද ප්‍රශ්නය විසඳී ඇත. කරුණානිධි කිලිනොච්චියේ කොටු වී ඇතැයි කියන දෙමළ ජනයා පිළිබඳ හෙළුවේ කිඹුල් කඳුළු ය. එහි දී ඔහු වයිකෝ ගේ පක්ෂයට හා ඉන්දිය කොමියුනිස්ට් පක්ෂයට ප්‍රතිචාර දැක්වූ අතර ප්‍රභාකරන් බේරාගැනීමට ද උප්පරවැට්ටියක් කෙළේ ය. ඉන්දිය කොමියුනිස්ට් පක්ෂයේ තමිල්නාඩු ශාඛාව කිලිනොච්චි දෙමළ ජනතාව වෙනුවෙන් කතාකරන්නේ කරුණු හරිහැටි නො දැන හා කසිකබල් මාක්ස්වාදී ස්ථාවරයක් ගනිමින් ය. කරුණානිධි ඇතුළු පිරිස් ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයට හා වයිකෝගේ පක්ෂයට ප්‍රතිචාර නොදක්වා කරුණාකරන් හෙවත් කරුණා අම්මාන් හෙවත් කරුණා හෙවත් මුරලිදරන් සමග කතාකිරීමට පෙළඹුණි නම් තව තවත් විස්තර දැනගැනීමට තිබුණි.

කරුණා නොබෝ දා කියා ඇත්තේ ඔහුට පොලිස් බලතල හා ඉඩම් පැවරීම් අනවශ්‍ය බව ය. කරුණාගේ මේ ප්‍රකාශය මෙරට හා ඉන්දියාවේ දේශපාලනයෙහි යෙදෙන කසිකබල් මාක්ස්වාදීන් ට ද කරුණානිධි ට හා ඉන්දියාවට ද වැදගත් වෙයි. කරුණානිධි වයිකෝට හා ඉන්දිය කොමියුනිස්ට් පක්ෂයේ තමිල්නාඩු ශාඛාවට සවන්දෙනු වෙනුවට කරුණා අම්මාන්ට සවන් දෙන්නේ නම් ලංකාවේ දේශපාලනය ගැන යම් අවබෝධයක් ලබාගැනීමට හැකිවනුඇත. එහෙත් ඔහු එසේ කරාවි යැයි සිතිය නො හැකි ය. කෙසේ වෙතත් කරුණානිධි කලින් තර්ජනය කළ ද ලෝක්සභාවේ මන්ත්‍රීධුරවලින් අස්වීමට තම මන්ත්‍රීවරුන්ට උපදෙස් නොදීමට දැන් තීරණය කර ඇත. මධ්‍යයෙහි කොංග්‍රසය සමග ඇති සංධානය නොවන්නට කරුණානිධිගේ දේශපාලන ආධිපත්‍යය නො රැකෙනු ඇත. එබැවින් කොංග්‍රස් පක්ෂයට කරුණානිධිගේ උප්පැරවැට්ටි සමනය කර පරාජය කිරීමට එතරම් කාලයක් ගතවූයේ නැත.

අප පසුගිය සතියේ කියා සිටියේ අවශ්‍ය රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියා හා වෙනත් ක්‍රියාකාරකම් යොදාගනිමින් කරුණාම්ධිගේ ප්‍රශ්නය විසඳාහත හැකි බව ය. ඒ එසේ ම සිදුවීම ගැන අපි සතුටු වෙමු. එහෙත් සමස්ත ප්‍රශ්නය විසඳීමට තවත් කාලයක් ගතවෙයි. එයට හේතුව තවමත් ප්‍රශ්නය කුමක්දැයි සාකච්ඡා කෙරී නොමැති වීම ය. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම සිදු වී ඇති අසාධාරණයක් නොමැති වීම, එසේ අසාධාරණ තිබුණ ද දෙමළ ජනයාගෙන් බහුතරය උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිටත සිටිය දී ඒ පළාත් දෙකෙහි දෙමළ මහඇමතිවරුන් පත්වන අයුරින් පළාත්සභාවලට බලය පවරා බහුතර දෙමළ ජනයාගේ ඇතැයි කියන ප්‍රශ්නය විසඳීමට නොහැකි වීම මෙහි දී සැලකිල්ලට ගතයුතු කරුණු අතර වෙයි.

ඒ අතර ඉන්දියාව අනුගමනය කරමින් ප්‍රාන්තවලට බලය බෙදීම අමනෝඥ ක්‍රියාවක් ද වෙයි. ඉන්දියාව බ්‍රිතාන්‍යයන් පැමිණීමට පෙර කිසි දිනෙක එක් රටක් හෝ රාජ්‍යයක් හෝ නො වී ය. වත්මන් පකිස්ථානය හා බංගලාදේශය ද එක්කරමින් ඉන්දියාව යනුවෙන් රටක් නිර්මාණය කළෝ බ්‍රිතාන්‍යයෝ ය. ඉන්දියාවට නිදහස ලබාදීමෙන් පසුව මේ රට තවදුරටත් එක් රටක් ලෙස ගෙනයෑමේ ප්‍රශ්නය විය. මෙරට ඇතැම් පඬියන් කියන්නේ ඉන්දියාවේ දැවැන්ත නිදහස් සටනක් වූ බැවින් එය එක් රටක් ලෙසත් ජාතියක් ලෙසත් නැගී සිටිය බව ය. එහෙත් එය බොරුවක් බව නොදන්නා අයකු සිටිය නො හැකි ය. අද වන විට බ්‍රිතාන්‍ය ඉන්දියාව රටවල් තුනක් බවට පත් වී ඇත. අද ඉන්දියාව යනුවෙන් හැඳින්වෙන කෘත්‍රිම රාජ්‍යය පවත්වාගෙන යනුයේ ඊනියා නිදහස් සටනකින් රට එකතු වූ නිසා නොව ඉන්දීය මධ්‍යම ආණ්ඩුවේ ආර්ථික හා යුදමය (දේශපාලන) ශක්තිය හේතුකොටගෙන ය.

ඉන්දියාවේ බ්‍රිතාන්‍යයන්ගෙන් පසුව තනි රටක් ගොඩනැගීමට ඇතැම් මහාරාජාවරු එකඟ නො වූහ. ඔවුහු නිදහසින් පසුව ද ඉන්දීය රාජ්‍යයෙන් පිටත තම ප්‍රාදේශීය රාජ්‍ය පවත්වාගෙන ගියහ. මේ රාජ්‍ය ඇතැම් විට ඉන්දීය රාජ්‍යයට එක්කරගනු ලැබුයේ මහාත්මා ගාන්ධිගේ අවිහිංසා නිදහස් සටනකින් නොව (එය අවිහිංසා සටනක් ද නො වි ය. මේ පිළිබඳ ව පසු දිනයක සාකච්ඡා කිරීමට අදහස් කරමි) නේරුගේ රාජ්‍ය බලය යෙදූ හමුදා ක්‍රියා මාර්ගයකින් ය. අද ලංකාවේ සිටින ව්‍යාජ ගාන්ධිලාට මේ කරුණු මතක් කර දිය යුතු ය. ඉන්දියාව යනු අවිහිංසාවෙන් උපන් රටක් නොව, (මහාත්මා ගාන්ධිගේ ද ඇතුළු) ලෙයින් උපන් රටකි.

© Prof. Nalin De Silva

ඒ කෙසේ වෙතත් ලංකාවේ තත්වය ඉන්දියාවට හාත්පසින් ම වෙනස් ය. අප එක් රාජ්‍යයක් එක් ජාතියක් වීම ඇරඹුයේ පඬුඅබා රජු දවස ය. පඬුඅබා යනු ව්‍යාජ චිත්‍රපටි චරිතයක් වන අබා නො වේ. අබා නම් ව්‍යාජ චිත්‍රපටිය විවිධ ආකාරයෙන් ආරක්ෂා කරන ව්‍යාජ දේශප්‍රේමී චරිත අද හෙළිදරව් වී ඇත. මේ ඇතැම් චරිත ද චිත්‍රපටිය මෙන් ම බොල් පිළිම බව දැන් පෙනී ගොස් ඇත. ඒ කෙසේ වෙතත් ලංකාවේ ඉන්දියාවේ මෙන් නව ජාතියක් ගොඩනැගීමේ අවශ්‍යතාවක් නැත. පඬුඅබා රජු දවස පිහිටුවීම ඇරඹූ ජාතියක් මෙරට වෙයි. මෙරට එක්සේසත් රාජ්‍යයක් පැවතී ඇත. අද අවශ්‍ය වන්නේ දෙමළ හා මුස්ලිම් ජනයා මේ රාජ්‍යයට එහි පුරවැසියන් ලෙස ඒ පිළිබඳ දැනුවත් ව එකතුකරගැනීම පිළිබඳ ප්‍රශ්නය ය. බ්‍රිතාන්‍යන් ඇතුළු බටහිරයන් හා ඔවුන් අනුව ගිය දෙමළ ජාතිවාදී ඇතැම් දේශපාලනඥයන් නොවන්නට මේ ප්‍රශ්නය දැනටමත් විසඳී අවසාන ය. එහෙත් බටහිරයෝ හා ඇතැම් දෙමළ දේශපාලනඥයෝ. අද වන විට නම් රාජ්‍ය නොවන සංවිධානවල බටහිර මුදල් ලෙවකන බැලයන් ද හවුල් කරගනිමින්, ඒ ප්‍රශ්නය විසඳාගැනීමට අකුල් හෙළති. මේ සියළු කරුණු සාකච්ඡා කරන සම්මන්ත්‍රණයක් හයවැනි බ්‍රහස්පතින්දා සවස කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට චින්තන පර්ෂදය කරයුතු කර ඇත.

ලංකාවට ඉන්දීය විසඳුම් කිසිසේත් ම ඓතිහාසික හා භූගෝලීය (ජනගහණ ව්‍යාප්ති) වශයෙන් ගත්කල සුදුසු නො වේ. ලංකාවට අවශ්‍යවන්නේ අපට අදාළ දේශජ විසඳුමකි. ඒ විසඳුමෙහි ප්‍රධාන කොටසක් වනුයේ කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව සාර්ථක ව කෙරීගෙන යන මානුෂික හමුදා මෙහෙයුම් ය. ඊනියා යුද්ධයකට විරුද්ධ වූ බොහෝ දෙනාට පසුගිය අවුරුදු විස්සක පමණ කාලයෙහි විවිධ අවස්ථාවල හමුදා මෙහෙයුම්වලට පක්ෂපාතිවීමට සිදුවීම අප ලැබූ ජයග්‍රහණයකි. සතිඅන්ත කසිකබල් පුවත්පතක කර්තෘවරයකුට ද අද ඔහුගේ ඇතැම් මිතුරන්ගේ විරුද්ධතාව මැද කොටින්ට විරුද්ධ මෙහෙයුම්වලට පක්ෂපාතිවීමට සිදු වී ඇත. වෙනත් කතුවරු හා ලේඛකයෝ ඔහුට පෙර ඒ පක්ෂපාතීත්වය දැක්වූහ.

එහෙත් බටහිරයන් තම ව්‍යායාමය තවමත් අත්හැර නැත. ලංකාවේ දේශපාලනය ගැන හොට දමන මෙරට ඇමරිකන් තානාපතිවරයා මේ තීරණාත්මක අවස්ථාවෙහි දී තකහනියක් වෙන්නායි නගරයට ගොස් ඊනියා දේශපාලන විසඳුම ගැන කතාකර ඇත. ඔහුට අවශ්‍ය වූයේ කරුණානිධි රත්කල යකඩය තලාගැනීම බව පැහැදිලි ය. ඔබාමා ඇමරිකාවේ ජනාධිපති වුවහොත් ඇමරිකන් බලපෑම් තවත් වැඩිවනු ඇත. ර කෙසේ වෙතත් පසුගිය දා කැළණිතිස්ස බලාගාරයට හා වෙනත් තැන්වලට එල්ල වූ ගුවන් ප්‍රහාරය අපේ සැලකිල්ලට යොමු විය යුතු ය. මේ ගුවන් යානා පදවන්නේ කොටි පමණක් ද?

කොටි යුද්ධ දක්ෂයන් නොවන බව අද කවුරුත් දනිති. මම එසේ කීමෙන් වීරෝදාර හමුදා භටයන්ට පිදිය යුතු ගෞරවය අබමල් රේණුවකින්වත් අඩුකිරීමට බලාපොරොත්තු නො වෙමි. කොටි මෙතෙක් කල් රැකුණේ අපේ හමුදාව සටනට නොගිය බැවිනි. අපේ හමුදා සටනට යැවීම බටහිරයෝ හා රාජ්‍ය නොවන බැළයෝ හා ඉන්දීය නායකයෝ ද වැළැක්වූහ. බටහිරයෝ කොටි දක්ෂතා ගැන ලෝ පුරා ප්‍රචාරය කළහ. ඔවුහු කොටි අපරාජිතයන් බව පැවසූහ. කොටින්ට පක්ෂව සිංහලයන්ට එරෙහිව බටහිර රටවල ගෙනගිය ප්‍රචාර කොටින්ගේ වැඩ නොව බටහිරයන්ගේ වැඩ විය. දෙමළ ජාතිවාදීහු දක්ෂයෝ නො වෙති. කොටින්ට ඇති ගුවන්යානා කතාව ද බටහිරයන්ගේ නිර්මාණයකි. කතාව පමණක් නොව ගුවන්යානා ද ඔවුන්ගේ නිර්මාණ වේ. මේ ගුවන්යානා ගුවන්ගත කරන්නේ කොහෙන් ද යන ප්‍රශ්නය අපි එදත් ඇසුවෙමු. අදත් අසමු. කිලිනොච්චිය හැරෙන්නට අනෙක් ප්‍රදේශ හමුදා යටතෙහි ඇතිවිට ගුවන් යානා හමුදාවට නොදැනී ගුවන්ගත කරන්නේ කෙසේ ද? ඒ ගුවන්යානා ප්‍රහාරවලින් පසු හමුදාවට නොදැනී පොළොවට පහත්වන්නේ කෙසේ ද? කොහෙන් ද? පොළොවෙහි සිට ද ඉලක්කයට පහරදීමට නොහැකි කොටි කැණහිළුන්ට ගුවනේ සිට ඉලක්කයට පහර දිය හැකි ද? පාබල හමුදාව සාර්ථකව කොටින්ට මුහුණ දෙත් දී ගුවන් හමුදාව තවමත් එසේ නොකරන්නේ කාගේ වරදකින් ද? ඉතා ඉක්මණින් මේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගැනීම රටේ යහපතට හේතු වෙයි. නැතහොත් අවසානයේ දී ජයගනු ඇත්තේ හමුදාවවත් රටවත් නොව අපට විරුද්ධව තැන තැන කතා පවත්වන ඇමරිකන් තානාපති ය. ගුවන් යානා ගුවන්ගත කිරීමට හැකි නැව් ඉන්දියන් සාගරයේ ඇති බව දන්නෝ දනිති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva